**01-11-2025 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, ඔබ මෙම ආධ්‍යාත්මික විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යයන්ය. ඔබගේ වගකීම වන්නේ මුළු විශ්වයටම පරම පියාගේ පණිවිඩය ලබාදීමය.

**ප්‍රශ්නය:** ඔය දරුවන් බෙර ගසන්නේ කුමක් ගැනද, එමෙන්ම ඔබ සෑම කෙනෙකුටම විස්තර කර දෙන්නේ කුමක්ද?

**පිළිතුර:** නව දිව්‍යමය රාජධානිය නැවත වරක් ස්ථාපිත වන බව සහ සියලුම අසංඛේය ආගම් දැන් විනාශ වීමට යන බව, සෑම කෙනෙකුටම පැවසීමට ඔබ බෙර ගසයි. මෙය ජාත්‍යන්තර ප්‍රශ්නයක් බැවින්, ඔබ සෑම කෙනෙකුටම සැහැල්ලුවෙන් සිටින්නට යැයි කියයි. යුද්ධය අනිවාර්යෙන්ම සිදුවන අතර, ඉන්පසු දිව්‍යමය රාජධානිය පැමිණෙයි.

ඕම් ශාන්ති. මෙය ආධ්‍යාත්මික විශ්ව විද්‍යාලයයි. මුළු විශ්වයේම ජීව, විශ්ව විද්‍යාලයක ඉගෙනුම ලබයි. 'විශ්වය' යනු ලෝකයයි. නීත්‍යානුකූලව, 'විශ්ව විද්‍යාලය' යන වචනය බලපාන්නේ ඔය දරුවන්ටයි. මෙය ආධ්‍යාත්මික විශ්ව විද්‍යාලයක්. මෙය භෞතික විශ්ව විද්‍යාලයක් විය නොහැක. මෙය එකම එක දෙව් පියාණන්ගේ විශ්ව විද්‍යාලයයි. සියලුම ජීවාත්මයන්ට පාඩම් ලැබෙයි. ඔබගේ මෙම පණිවිඩය අනිවාර්යෙන්ම එක් හෝ තව ක්‍රමයකින් සෑම කෙනෙක් වෙතටම යා යුතුයි. ඔබ මෙම පණිවිඩය දිය යුතුයි. මෙම පණිවිඩය ඉතාමත්ම සරලයි. ඔය දරුවන් දන්නවා ඔහු සෑම කෙනෙක්ම සිහි කරන කෙනාය, අපගේ අසීමිත පියා බව. ඔහු ඔබගේ අසීමිත ආදරවන්තයා බවත් ඔබට කිව හැක, එමෙන්ම ලෝකයේ සියලුම සජීවී ජීව, අනිවාර්යෙන්ම එම ඒකායන ආදරවන්තයාව සිහි කරන බව. ඔබ මෙම කරුණු ඉතා හොඳින් ධාරණය කරගත යුතුයි. නැවුම් බුද්ධි ඇති අයට සෑම දෙයක්ම ඉතා හොඳින් ධාරණය කිරීමට හැකි වෙයි. විශ්වයේ සියලුම ජීවාත්මයන්ගේ පියා එක්කෙනෙක් පමණයි. විශ්ව විද්‍යාලයක ඉගෙනුම ලබන්නේ මනුෂ්‍යයින් පමණයි. උපත් 84 ක් ගන්නා අය ඔබ බවත් ඔය දරුවන් දන්නවා. උපත් මිලියන 8.4 ක් ගැන ප්‍රශ්නයක් නැත. මෙකල ලෝකයේ සියලුම ජීවාත්ම අපවිත්‍රයි. මෙම කිලිටි ලෝකය, දුක් දේශයයි. ඔබව සතුටු දේශයට ගෙන යන්නේ ඒකායන පියා පමණයි. ඔහුට විමුක්තිය ලබා දෙන්නා යැයිද කියයි. ඔබ මුළු ලෝකයේම සහ විශ්වයේම අධිපතියන් බවට පත් වනවා. පරම පියා ඔබ සැමට පවසන්නේ ගොස් සියලුම දෙනාට මෙම පණිවිඩය ලබා දෙන්න. සෑම කෙනෙක්ම පියාව සිහි කරනවා. ඔහුට මාර්ගෝපදේශකයා, විමුක්තිය ලබා දෙන්නා සහ දයාවන්ත කෙනා යැයි කියයි. බොහෝ භාෂා තිබේ. සියලුම ජීවාත්ම කන්නලව් කරන්නේ එක්කෙනාටයි. එබැවින් එම කෙනා මුළු විශ්වයේම ගුරුවරයාද වෙයි. ඔහු කොහොමත් පියාය, නමුත් කිසි කෙනෙක් නොදන්නේ, ඔහු අප සියලුම ජීවයන්ගේ ගුරුවරයා මෙන්ම ගුරුද බවත්ය. ඔහු සෑම කෙනෙකුට මාර්ගෝපදේශකයෙක්ද වෙයි. අසීමිත මාර්ගෝපදේශකයාව හඳුනන්නේ, ඔය දරුවන් පමණයි. ඔය බ්‍රහ්මණයන් හැර වෙනත් කිසිවෙකු ඔහුව හඳුනන්නේ නැත. ජීවාත්මයක් යනු කුමක්ද කියා වැටහෙන්නේ ඔබට පමණයි. ජීවාත්මයක් යනු කුමක්ද කියා ලෝකයේ එකදු මනුෂ්‍යයෙකුටවත් වැටහෙන්නේ නැත. සාමාන්‍ය වශයෙන් ලෝකයේත් විශේෂයෙන්ම භාරතයෙත්, කිසිම කෙනෙකුට, ජීවාත්මයක් යනු කුමක්ද කියා වැටහෙන්නේ නැත. නළල මධ්‍යයේ ආශ්චර්යමත් තාරකාවක් දිලිසෙන බව ඔවුන් පැවසුවත්, ඔවුන්ට කිසි දෙයක් වැටහෙන්නේ නැත. ජීවාත්ම අවිනාශී බව, ඔබට දැන් වැටහෙයි. මෙම ජීවාත්මය කිසිම විටෙක විශාල හෝ කුඩා වන්නේ නැත. ඔබ ජීවාත්මයක් වන සේම පරම පියාද කුඩා තිතකි ඔහු ඊට වඩා විශාල හෝ කුඩා නැත. ඔහුද ජීවාත්මයක් වන නමුත් ඔහු පරමාත්ම ජීවයයි, පරමාත්මයයි. සැබවින්ම සියලුම ජීවාත්ම වාසය කරන්නේ පරම දනව්වේය. ඔවුන් මෙහි පැමිණෙන්නේ ඔවුන්ගේ චරිත කොටස් රඟපෑමටයි. ඉන්පසුව ඔවුන් ආපසු ඔවුන්ගේ පරම නිවහනට යෑමට උත්සාහ දරයි. සෑම කෙනෙක්ම පරම පියා, පරමාත්ම ජීවය සිහි කරයි, මන්ද ජීවාත්මයන්ව විමුක්තිය කරා රැගෙන යන්නේ පරම පියා පමණක් බැවින් ඔවුන් ඔහු සිහි කරන්නේ මේ නිසාය. ජීවාත්ම, තමෝප්‍රධාන් වී ඇත. ඔවුන් ඔහු සිහි කරන්නේ ඇයි? ඔවුන් මෙයවත් නොදනී. ළදරුවෙක් 'බාබා' කියයි, එපමණයි ඔහු කිසිවක් නොදනී. ඒ අන්දමින්ම ඔබත් 'බාබා, මම්මා' කියන නමුත් ඔබ කිසිවක් නොදනී. භාරතයේ එක් ජාතියක් පමණක් තිබුණු අතර එයට දේවතා ජාතිය යැයි කියන ලදි. පසුකල වෙනත් බොහෝ ජාතීන් ඇතුළු විය. දැන් බොහෝ ජාතීන් සිටින අතර මෙතරම් බොහෝ සටන් ආදිය තිබෙන්නේ මේ නිසාය. ඕනෑම තැනක වෙනත් ජාතීන් බොහොමයක් සිටින විට, වැසියන් ඔවුන්ව පිටමං කිරීමට දිගටම උත්සාහ දරයි. බොහෝ සටන් ඇතිවෙයි. අන්ධකාරය ද බොහෝ තිබේ. මෙයට

යම් සීමාවක් තිබිය යුතුයි. නළුවන් සංඛ්‍යාවට සීමාවක් තිබේ. මෙම නාටකය පෙර නියම වූවකි. කෙතරම් නළුවන් සංඛ්‍යාවක් සිටින්නේද, එම සංඛ්‍යාවට වඩා වැඩියෙන් හෝ අඩුවෙන් සිටිය නොහැක. සියලුම නළුවන් වේදිකාවට පැමිණි විට, ඉන්පසුව ඔවුන් ආපසු නිවසට යා යුතුයි. එහි උඩ ඉහළ තවමත් ඉතිරි වී සිටින සියලුම නළුවන් අඛණ්ඩව මෙහි පහළට පැමිණෙනවා. ඔවුන් ජනගහණය පාලනය කිරීමට කෙතරම් වෙහෙස වුවත්, එය කිරීමට ඔවුන්ට නොහැකි වී තිබේ. ඔවුන්ට කියන්න බීකේවරුන් වන අපට කෙබඳු උපත් පාලනයක් තිබේද යත්, ඉතිරි වන්නේ 900,000 ක් පමණයි. මුළු ජනගහණයම අඩුවෙයි. අප ඔබට පවසන්නේ සත්‍යයයි අපි දැන් එම ලෝකය ස්ථාපිත කරනවා. නව ලෝකය, නව ගස, අනිවාර්යෙන්ම කුඩා වෙයි. මෙහි කිසිවෙකුට මෙය පාලනය කළ නොහැක, මන්ද ලෝකය වැඩි වැඩියෙන් තමෝප්‍රධාන් වන බැවින්. ජනගහණය එන්න එන්නම වැඩිවනවා. තවමත් පැමිණීමට ඇති සියලුම නළුවන් මෙහි පැමිණ, ශරීර ගනී. මෙම දේවල් කිසි කෙනෙකුට නොවැටහෙයි. රාජධානියේ සියලුම ආකාරයේ නළුවන් සිටින බව, තියුණු බුද්ධි ඇති අය තේරුම් ගනීවි. ස්වර්ණමය යුගයේ පැවතුණු රාජධානිය, නැවතත් ස්ථාපිත කෙරෙනවා. ඉන්පසුව ඔබව මාරු කර හරියි. ඔබ දැන් තමෝප්‍රධාන් පංතියෙන් සතෝප්‍රධාන් පංතියට මාරු කෙරෙනවා. ඔබ පැරණි ලෝකයෙන් නව ලෝකයට යනවා. ඔබගේ ඉගෙනුම මෙම ලෝකයට නොවෙයි. එවන් තවත් විශ්ව විද්‍යාලයක් තිබිය නොහැක. පරමාත්ම දෙවියන් වන පරම පියා, මෙසේ පවසයි මා ඔබට උගන්වන්නේ අමරණීය දේශය වෙනුවෙනි. මෙම මරණීය දේශය, විනාශ විය යුතුයි. ස්වර්ණමය යුගයේ ලක්ෂ්මී සහ නාරායන්ගේ රාජධානිය පැවතුණි. එය ස්ථාපිත වූයේ කෙසේද කියා කිසිවෙක් නොදනී. බාබා සෑම විටෙකම පවසන්නේ ඔබ දේශනයක් කිරීමට යන විට, ලක්ෂ්මී සහ නාරායන්ගේ පිංතූරය ඔබ ළඟ අනිවාර්යෙන්ම තිබිය යුතුයි. දිනයද එය මත ලිවිය යුතුයි. නව ලෝකයේ ආරම්භයේ සිට වසර 1250 ක් එය එම පෙළපතේ රාජධානිය බව, ඔබට විස්තර කළ හැක. ඒ අන්දමින්ම මෙසේද කියයි: ක්‍රිස්තියානි පෙළපතේ රාජධානිය තිබුණා ඔවුන් අඛණ්ඩව එකිනෙකාව අනුගමනය කරයි. දේවතා පෙළපත පැවතුණු කළ, වෙනත් කිසිවෙකු සිටියේ නැත. මෙම පෙළපත, දැන් නැවත වරක් ස්ථාපිත කෙරෙනවා. අන් සියලු දෙනාම විනාශ විය යුතුයි. යුද්ධය ඔබ ඉදිරියේ සිටගෙන සිටියි. භගවතය ආදියේ ඇති කතා පුවත් පදනම් වී ඇත්තේ මෙය මතයි. ළදරු කාලයේදී අප මෙම කතා පුවත් වලට සවන් දුන්නා. රාජධානිය ස්ථාපිත වන්නේ කෙසේද කියා ඔබට දැන් වැටහෙනවා. පරම පියා අපට අනිවාර්යෙන්ම රාජයෝගාව ඉගැන්නුවා. සමත් වන අය, මාලාවේ පබුළු බවට පත් වන අතර, අන් අය මෙම මාලාව ගැන කොහෙත්ම දන්නේ නැහැ. මෙය දන්නේ ඔබ පමණයි. ඔබගේ මාවත, ගෘහස්ථ මාවතයි. බාබා ඉහළින් සිටගෙන සිටිනවා. ඔහුගේම සිරුරක් ඔහුට නැත. ඉන්පසුව, නාරායන් සහ ලක්ෂ්මී බවට පත් වන, බ්‍රහ්මා සහ සරස්වති සිටිනවා. පළමුව පියා සිටිය යුතු අතර, ඉන්පසුවයි යුවළ සිටින්නේ. රුද්‍රාක්ෂයේ පබුළු තිබේ. ඔවුන් රුද්‍රාක්ෂයේ පබුළු ගන්නා ගසක් ඔවුන්ට නේපාලයේ ඇත. එහි ඇතැම් සැබෑ ඒවා තිබේ ඒවා කුඩා වන තරමට, මුදලින් වැඩිය. මෙහි අරුත ඔබට දැන් වැටහෙයි. විෂ්ණුගේ මාලාව වන ජයග්‍රහණයේ මාලාව, එනම්, රුන්ඩාගේ මාලාව නිර්මාණය කෙරෙනවා. ඒ මිනිසුන් මාලාවක පබුළු නිකමට බ්‍රමණය කරමින් රාමාගේ නම මතුරයි, නමුත් එහි තේරුමක් නැත. ඔවුන් දිගටම මාලාවක පබුළු බ්‍රමණය කරයි. මෙහි, පරම පියා පවසන්නේ මා සිහි කරන්න! නිහඬ මැතිරිල්ල මෙයයි. ඔබගේ මුවින් ඔබ කිසිවක් කිව යුතු නැහැ. ගීත වුවත් භෞතිකයි. ඔය දරුවන්ට තිබෙන්නේ පරම පියා සිහි කිරීම පමණයි. එසේ නැත්නම් ඔබ දිගටම ගීත සිහිපත් කරයි. මෙහි ඇති ප්‍රධානතම දෙය වන්නේ සිහිපත් කිරීමය. ඔබ ශබ්දය ඉක්මවා යා යුතුයි. පරම පියාගේ උපදේශය වන්නේ මන්මනභව! පියා ඔබට ගීත ගායනා කිරීමට හෝ හඬ නගා කතා කිරීමට නොකියයි. මගේ වර්ණනාව ගායනා කිරීමට අවශ්‍ය නැහැ. ඔහු ඥානයේ මහා සයුර මෙන්ම සාමයේ සහ සතුටේ මහා සයුර බව ඔබ දන්නවා. මනුෂ්‍යයන්ට මෙය වැටහෙන්නේ නැත. ඔවුන් ඔහුට එම නම නිකම්ම ලබා දී තිබේ. ඔබ හැර වෙන කිසිවෙකු මෙය නොදනී. පරම පියා පැමිණ ඔබට ඔහුගේ නම සහ ස්වරූපය කියයි. ඔහු කුමන ආකාරයේද එමෙන්ම ඔය ජීවාත්ම කුමන ආකාරයේද කියා ඔහු පහදා දෙයි. ඔබගේ චරිත කොටස් රඟපාමින් ඔබ බොහෝ උත්සාහ දරා ඇත. ඔබ චක්‍රයෙන් භාගයක්ම භක්තියේ යෙදෙමින් සිටියා. මා එවන් චරිත කොටසක් රඟපාන්නේ නැත. මා සතුට සහ දුක ඉක්මවා සිටිමි. ඔබ දුක් අත්විඳින අතර, ඉන්පසුව ස්වර්ණමය යුගයෙදී ඔබ සතුට අත්විඳියි. ඔබගේ චරිත කොටස් මට වඩා ඉහළයි. මා චක්‍රයෙන් භාගයක්ම විශ්‍රාමික තත්ත්වයේ එහි උඩ ඉහළ සුවෙන් අසුන් ගෙන සිටිනවා. ඔබ දිගින් දිගටම මට අඬගසනවා. මා එහි අසුන් ගෙන සිටින විට ඔබගේ කන්නලව්ව මට ඇසෙන්නේ නැහැ. මගේ කොටස තිබෙන්නේ මෙකලයි. මම නාටකයේ කොටස දන්නවා. නාටකය දැන් අවසානයකට එනවා. මා පැමිණ, වෙනත් කිසිවක් නොව, අපවිත්‍ර අයව පිවිතුරු කිරීමේ කොටස රඟදැක්විය යුතුයි. මිනිසුන් විශ්වාස කරන්නේ, පරමාත්ම ජීවය, සර්ව බලධාරියා බැවින්, ඔහු සෑම කෙනෙකුගේම ඇතුලාන්තයේ ඇති දේ දන්නා බවයි.

ඔවුන් සිතන්නේ සෑම කෙනෙකුගේම ඇතුලාන්තයේ සිදුවන දේ, ඔහු දන්නා බවයි. පරම පියා පවසන්නේ එය එසේ නොවෙයි. ඔබ සම්පූර්ණයෙන්ම තමෝප්‍රධාන් වූ විට, එවිට මා පැමිණිය යුතු නිවැරදි වෙලාව එයයි. මා සාමාන්‍ය සිරුරකට ඇතුළු වන්නෙමි. මා පැමිණ ඔය දරුවන්ව දුකින් මුදවාගන්නවා. බ්‍රහ්මා මාර්ගයෙන් එක් ධර්මයේ ස්ථාපනයත්, ශංකර් මඟින් අසංඛ්‍යෙය ආගම් වල විනාශයත් සිදුවෙයි. අසරණ බවේ හඬවල් වලට පසුව ජයග්‍රහණයේ හඬ ඇතිවෙයි. බොහෝ විපත් සිදුවෙයි! මිනිසුන් අඛණ්ඩව ව්‍යසන වලදී මිය යනු ඇත. ස්වභාවික ව්‍යසන වලින් බොහෝ උපකාර ලැබෙයි. එසේ නැත්නම් මනුෂ්‍යයින් බොහෝ අසරණ වී, බොහෝ දුක් විඳිනු ඇත. පරම පියා පවසන්නේ දරුවන් දිගින් දිගටම දුක්විඳීම සිදු නොවීමට, ස්වභාවික ව්‍යසන විශාල බලයකින් පැමිණ, සියලු දෙනාවම විනාශ කර දමයි. බෝම්බ එතරම් දෙයක් නොවෙයි! ස්වභාවික ව්‍යසන බොහෝ සේ උපකාර කරයි. භූමි කම්පාවලදී බොහෝ මිනිසුන් මිය යති. වරක් හෝ දෙවරක් ජල රැළි පැමිණ ඔවුන් මිය යයි. විශාල සාගර රැළි ඇතිවෙයි අඩි සියයක් උස මුහුදු රැළි පොළව ගිල ගනී. එවිට කුමක් සිදුවෙයිද? අසරණ බවේ ජවනිකා ඇතිවෙයි. එවන් ජවනිකා නැරඹීමට බොහෝ එඩිතරකම අවශ්‍ය වෙයි. ඔබ උත්සාහද දරමින් නිර්භය විය යුතුයි. ඔය දරුවන් තුළ කිසිම අහංකාරකමක් නොතිබිය යුතුයි. ජීවාත්ම අවධානයට පත් වන්න! ජීවාත්ම අවධානයෙන් සිටින අය, බොහෝ සේ මිහිරියි. පරමාත්ම පියා පවසන්නේ මම අශාරීරක මෙන්ම අසහායයි. මා මෙහි පැමිණෙන්නේ සියලු දෙනාටම සේවය කිරීමටයි. බලන්න, මිනිසුන් මට මොන තරම් ප්‍රශංසා කරනවාද කියා? ඥාන මහා සයුර. අහෝ බාබා! ඉන්පසුව ඔවුන් කියන්නේ අපවිත්‍ර ලෝකයට පැමිණෙන්න! ඔබ මට ඉතා හොඳ ආරාධනාවක් කරය! එහි ඇති සතුට දැක බලාගැනීමට, ඔබ මට දිව්‍ය ලෝකයට පැමිණෙන්නට කියා කියන්නේවත් නැත! ඔබ කන්නලව් කරන්නේ අහෝ පාරිශුද්ධකරුවාණෙනි, අපි අපවිත්‍රයි! ඇවිත් අපව පිවිතුරු කරන්න! බලන්න ඔබ මට දෙන ආරාධනාව දෙස! ඔබ මට සම්පූර්ණයෙන්ම තමෝප්‍රධාන් සහ අපවිත්‍ර ලෝකයකට සහ අපවිත්‍ර ශරීරයකට ආරාධනා කරයි! භාරතයේ ජනතාව වන ඔබ, මට හරිම හොඳ ආරාධනාවක් කරයි! නාටකයේ වැදගත්කම එයයි. මෙය ඔහුගේ බොහෝ උපත් වල අවසන් උපත බව, මෙම කෙනා දැන සිටියේ නැහැ. ඔහුට එය කියන ලද්දේ, බාබා ඔහු තුළට ඇතුළු වුවාට පසුවයි. බාබා සෑම දෙයකම වැදගත්කම විස්තර කර දී ඇත. බ්‍රහ්ම, ඔහුගේ භාර්යාව වීමට තිබුණා. බාබාම පවසන්නේ මෙම කෙනා මගේ බිරිඳයි. මා ඔහු තුළට ඇතුළු වී, ඔහුගේ මාර්ගයෙන් ඔබව දරුකමට හදාගන්නවා. සැබෑ ජ්‍යෙෂ්ඨ මව මෙම කෙනා වන අතර, අනෙක් කෙනා හදාගත් මවයි. ඔවුන්ට 'මව සහ පියා' කියා ඔබට ඇමතිය හැක. ඔබ 'පියා' යැයි කියන්නේ ශිව බාබාට පමණයි. මෙම කෙනා බ්‍රහ්ම බාබාය. මම්මා අදෘෂ්‍යමානයි. බ්‍රහ්මා, මව වන නමුත් ඔහුට පිරිමියෙකුගේ සිරුරක් තිබේ. ඔහුට ඔබව බලාගැනීමට නොහැක, මේ නිසයි දියණියව දරුකමට හදාගත්තේ. ඇයට, මාතේශ්වරී, සරස්වතී යන නම ලබා දී තිබේ. නායිකාව ඇයයි. නාටකයට අනුව සිටින්නේ එක් සරස්වතී පමණයි, නමුත් බොහෝ නම් තිබේ දුර්ගා, කාලී ආදිය. සිටිය හැක්කේ එක් මවක් සහ පියෙක් පමණයි. ඔබ සියලුම දෙනා දරුවන්ය. සරස්වතී, බ්‍රහ්මාගේ දියණිය බව මෙනෙහි කර තිබේ. ඔබ බ්‍රහ්ම කුමර කුමරියන්ය, ඔබට බොහෝ නම් දී තිබේ. මෙම සියලුම දේවල් වටහා ගන්නා අය, ඒවා වටහාගන්නේද අංක පිළිවෙලටයි. ඉගෙනුමකදී, සෑම කෙනෙක්ම අංකානුරූපයි එක්කෙනෙක් තව කෙනෙකුට සමාන විය නොහැක. මෙම රාජධානිය ස්ථාපිත කෙරෙනවා. මෙම නාටකය පෙර නියම වූවකි. එය බොහෝ විස්තරාත්මකව වටහාගත යුතුයි. බොහෝ කරුණු තිබේ. නීතිඥයින් වීමට ඉගෙනගන්නා අය වුවද, අංකානුරූපයි. සමහර නීතිඥයින්ට ලක්ෂ දෙකක් හෝ තුනක් උපයා ගැනීමට හැකි වන අතර, තවත් අය ඉරුණු ඇඳුම් අඳියි. මෙහිද සිදුවන්නේ එයමයි. ජාත්‍යන්තර ප්‍රශ්නයක් ඇතිවීමට යන බව, ඔය දරුවන්ට විස්තර කර ඇත. ඔබ දැන් සෑම කෙනෙකුටම සැහැල්ලුවෙන් සිටීමට කිව යුතුයි. යුද්ධය අනිවාර්යෙන්ම සිදුවෙයි. නව දිව්‍යමය රාජධානිය, නැවත වතාවක් ස්ථාපිත වන බව කීමට, ඔබ බෙර ගසයි. අසංඛ්‍යෙය ආගම් වල විනාශය ඇතිවෙයි. මෙය ඉතාමත්ම පැහැදිලියි! මේ මිනිසුන් සියලු දෙනාම නිර්මාණය වන්නේ ප්‍රජාපිතා බ්‍රහ්මා තුළිනි. ඔහු පවසන්නේ මේ මගේ මුඛයෙන් උපන් නිර්මාණයයි. ඔබ මුඛයෙන් උපන් බ්‍රහ්මණයන්ය. අනෙත් බ්‍රහ්මණයන් උපදින්නේ පාපය තුළිනි. ඔවුන් වඳින්නන් වන අතර, ඔබ දැන් පිදුම් ලබන්නට සුදුස්සන් බවට පත් වනවා. ඔබ පිදුම් ලබන්නට සුදුසු දේවතාවන් බවට පත් වන බව ඔබ දන්නවා. ඔබට දැන් ආලෝකමත් කිරුළක් නැත. ඔය ජීවාත්ම පාරිශුද්ධ වූ විට, ඔබ ඔබගේ සිරුරු හැර යනු ඇත. ඔබගේ වර්තමාන ශරීර තුළ සිටින විට, ඔබට ආලෝකමත් කිරුළක් ලබා දිය නොහැක එය ඔබට නොගැලපෙයි. මෙකල ඔබ ප්‍රශංසා ලැබීමට පමණක් සුදුසුයි. මෙකල කිසිම ජීවයක් පිවිතුරු නැත, එම නිසයි කිසි කෙනෙකුට මෙකල ආලෝකමත් කිරුළක් තිබිය නොහැක්කේ. ආලෝකය පවතින්නේ ස්වර්ණමය යුගයේය. අංශක දෙකක් අඩුවෙන් ඇති අය මත, මෙම ආලෝකය නොපෙන්විය යුතුයි. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදැසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. අවසන් විනාශයේ ජවනිකා ඔබට දැක ගැනීමට හැකි වන පරිදි, තමන්ගේ ස්ථිතිය බොහෝ නොසෙලවෙන සහ නිර්භීත කරගන්න. ජීවාත්ම අවධානයට පත් වීමට උත්සාහ දරන්න.
2. නව රාජධානියේ උසස් තත්ත්වයක් හිමි කරගැනීම සඳහා, ඔබගේ ඉගෙනුමට සම්පූර්ණ අවධානය යොමු කරන්න. සමත් වී, ජයග්‍රාහක මාලාවේ පබුළුවක් වන්න.

**වරදානය:** ඔබ නිරන්තරයෙන් පරමාත්ම දෙවියන් සහ ඔබේ වාසනාව පිළිබඳව අවධානයෙන් සිට වඩාත් උසස්, වාසනාවන්ත ජීවාත්මයක් බවට පත්වේවා.

**පාඨය:** **අව්‍යක්ත සංඥාව: අශාරීරික (අශරීරී සහ විදේහි) පුහුණුව වැඩි කරන්න.**

***** ඕම් ශාන්ති *****

අශරීරික වීම යනු ශබ්දය ඉක්මවා යාමයි. ශරීරය ඇති විට ශබ්දය ඇත. ශරීරයෙන් ඔබ්බට ගිය විට නිශ්ශබ්දතාවයක් ඇති වේ. තත්පරයකට සේවය පිළිබඳ සිතිවිලි ඇති කර තත්පරයකින් ඕනෑම සිතිවිල්ලකින් ඔබ්බට ගිය කෙනෙකුගේ ප්‍රතිමූර්තියක් බවට පත් වන්න. යම් කාර්යයක් කිරීමට ඔබේ ශරීරය ගැන දැනුවත් වී පසුව අශරීරික වන්න. මෙම අභ්‍යාසය ස්ථිර වූ විට, ඔබට සියලු අහිතකර අවස්ථාවන්ට මුහුණ දීමට හැකි වනු ඇත.